නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
FMM SRI LANKA Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව

## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை

## Media Freedom Rights Monitoring Report

MFRMD

2023 අප්‍රේල්

3 වන වෙළුම - කලාප අංක 04










**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උපයෝගී කර ගන්නා විෂය පථයට/ සංරචකයන්ට අදාළ සිදුවීම් 15ක් 2023 අප්‍රේල් මාසයේදී නිරීක්ෂණය විය. ආරක්ෂාව හා සුරක්ෂිතබව යන සංරචකයට අයත් සිදුවීම් 04ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 6ක්, වෘත්තියවේදිත්වයට අදාළ එක් සිදුවීමක් සහ ව්‍යුහාත්මක කොන්දේසි යන සංරචකයට අදාළ සිදුවීම් 4ක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. ඇමතිවරයකු විසින් සිදු කරන ලද තර්ජනයක් පිළිබඳව මාධ්‍යවේදී පුණ්‍යමූර්ති සසිකරන් පොලිසියට පැමිණිලි කිරීම.
2. වසන්ත මුදලිගේ නිදහස් කිරීමට එරෙහි අභියාචනය, කොළඹ මහාධිකරණය හමුවේ කැඳවීම.
3. පොලිසියෙන් කළ පහරදීම සම්බන්ධයෙන්, මාධ්‍යවේදී ශාන්ත විජේසූරිය පොලිස් මූලස්ථානයට පැමිණිලි කිරීම.
4. රජය විසින් කෙටුම්පත් කර ඇති නව ත්‍රස්ත විරෝධී පනත ප්‍රජාතන්ත්‍රවාදයට බරපතළ තර්ජනයක් බව හියුමන් රයිට්ස් වොච් සංවිධානය ප්‍රකාශ කිරීම.
5. යෝජිත ත්‍රස්ත විරෝධී පනතට ඇමරිකානු ජනාධිපතිවරයා විරෝධය පළ කළ යුතු යැයි ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය (Amnesty International) ප්‍රකාශ කිරීම.
6. යෝජිත ත්‍රස්ත විරෝධී පනත ඉවත් කර ගන්නා ලෙස ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම (ICJ) ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටීම.
7. යෝජිත ත්‍රස්ත විරෝධී පනත පිළිබඳව විමර්ශනය කිරීමට ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් කමිටුවක් පත් කරනු ලැබීම හා එම කමිටු වාර්තාව එළිදැක්වීම.

8. ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම කල් දැමීමට තීරණය කළ බව අධිකරණ ඇමතිවරයා ප්‍රකාශ කිරීම.

9. පාස්කු ප්‍රහාරය සම්බන්ධ විරෝධතාවක් තහනම් කරන ලෙස පොලිසිය කළ ඉල්ලීමක් අධිකරණය ප්‍රතික්ෂේප කිරීම.

10. සමාජ මාධ්‍ය ක්‍රියාකාරික දර්ශන හඳුන්ගොඩට එරෙහිව අධිකරණයෙන් වාරණ නියෝගයක් පැනවීම.

11. ආයතනයේ ප්‍රධානියකුගේ ලිංගික බලපෑම් නිසා සේවයෙන් ඉවත් වූ බව ITN රූපවාහිනියේ නිවේදිකාවක ප්‍රකාශ කිරීම.

12. ගුවන්විදුලි හා රූපවාහිනී සේවා නියාමනය සඳහා නව පනතක් කෙටුම්පත් කරන බව ජනමාධ්‍ය ඇමතිවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කිරීම.

13. සියදිවි නසාගැනීමක් පිළිබඳ ආචාරධර්මවලට පටහැනි වාර්තාකරණයක් සම්බන්ධයෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.

14. ඝාතනයට ලක්වූ මාධ්‍යවේදී ධර්මරත්නම් සිවරාම් අනුස්මරණය කිරීම.

15. ගෝල්ෆෙස්හිදී පැවති ඉෆ්තාර් උත්සවට සහභාගී වීමට පැමිණි පිරිසකට පොලිසිය අනිසි ලෙස බාධා කිරීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2023 අප්‍රේල්**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 04 |
| නීතිමය කොන්දේසි | 06 |
| වෘත්තියවේදීත්වය | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 04 |
| **එකතුව** | **15** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා 4ක් අප්‍රේල් මාසයේදී නිරීක්ෂණය විය.**

**2 වගුව: 2023 අප්‍රේල්: ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 04**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| පහරදීම් | 01 |
| මානසික බලපෑම් | 03 |
| **එකතුව** | **04** |

1. **ඇමතිවරයකු විසින් සිදු කරන ලද තර්ජනයක් පිළිබඳව මාධ්‍යවේදී පුණ්‍යමූර්ති සසිකරන් පොලිසියට පැමිණිලි කිරීම.**

   මාර්තු 30 වැනිදා පැවති මඩකලපු දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීමේදී රාජ්‍ය අමාත්‍ය සිවනේසතුරෙ චන්ද්‍රකාන්තන් විසින් තමන්ට තර්ජනය කළ බවට මාධ්‍යවේදියා විසින් CIB/iii/249/192 අංකය යටතේ මඩකලපුව මූලස්ථාන පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබේ.

   මූලාශ්‍රය: twitter.com/JDSLanka

02. **පොලිසියෙන් කළ පහරදීම සම්බන්ධයෙන්, මාධ්‍යවේදී ශාන්ත විජේසූරිය පොලිස් මූලස්ථානයට පැමිණිලි කිරීම.**

මාර්තු 31 වැනිදා නුගේගොඩදී පැවති අරගල සමරුවේදී උසස් පොලිස් නිලධාරියකු ඇතුළු පොලිස් නිලධාරීන් පිරිසක් විසින් සිදු කෙරුණු පහරදීම සම්බන්ධයෙන් අප්‍රේල් 6 වැනිදා මාධ්‍යවේදියා මෙම පැමිණිල්ල ඉදිරිපත් කළේය. අදාළ විරෝධතාව අතරතුර පොලිසිය සමාජ ක්‍රියාකාරික ළහිරු වීරසේකරට පහර දුන් අතර එය ඡායාරූපගත කරන අවස්ථාවේදී පොලිසියේ රාජකාරියට බාධා කරන බවට චෝදනා කරමින් තමන්ට පහරදුන් බව මාධ්‍යවේදියා ප්‍රකාශ කරයි.

මූලාශ්‍ර: www.youtube.com, thetime.lk

03. **ආයතනයේ ප්‍රධානියකුගේ ලිංගික බලපෑම් නිසා සේවයෙන් ඉවත් වූ බව ෂඕහ රූපවාහිනියේ නිවේදිකාවක ප්‍රකාශ කිරීම.**

ප්‍රකට රූපවාහිනී නිවේදිකාවක වන ඉෂාරා දේවේන්ද්‍ර, සිය ෆේස්බුක් ගිණුමේ සටහනක් තබමින් ප්‍රකාශ කර ඇත්තේ, අදාළ බලපෑම් පිළිබඳව වීඩියෝ සහ ඕඩියෝ සාක්ෂි සහිතව ආයතනයේ බලධාරීන්ට පැමිණිලි කළ නමුත් විසඳුමක් නොලැබුණු නිසා, ආත්ම ගෞරවය පිණිස සේවයෙන් ඉවත් වූ බවයි. ස්වාධීන රූපවාහිනියේ සභාපති සුදර්ශන ගුණවර්ධන විදේශගතව සිටින බවත්, ඔහු පැමිණි පසු මේ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන බවත් ජනමාධ්‍ය ඇමති බන්දුල ගුණවර්ධන අප්‍රේල් 25 වැනිදා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළේය.

මූලාශ්‍ර: www.ceylonmirror.net

04. **ගෝල්ෆේස්හිදී පැවති ඉෆ්තාර් උත්සවට සහභාගී වීමට පැමිණි පිරිසකට පොලිසිය අනිසි ලෙස බාධා කිරීම.**

අප්‍රේල් 9 වැනිදා පැවති මෙම උත්සවයට සහභාගී වීම සඳහා සංවිධායකයින් කළ විවෘත ආරාධනය අනුව එහි පැමිණි ආගමික හා ජාතික සහජීවනය අගය කරන පිරිසක් ආපසු හරවා යැවීමට පොලිසිය කටයුතු කර ඇති අතර මුස්ලිම් සහ අනෙකුත් ජාතීන් වෙන් කර හඳුනාගැනීම සඳහා ආගමික වාක්‍ය කියන ලෙස සහභාගී වූවන්ට බලපෑම් කර තිබේ. පොලිසියේ මෙම ක්‍රියාකලාපය සහභාගිකයන්ගේ හා සංවිධායකයින්ගේ දැඩි දෝෂදර්ශනයට ලක් විය. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සිලය විසින් පොලිස්පතිවරයාට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

මූලාශ්‍ර: facebook.com/tassy.dahlan, facebook.com

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 06ක් අප්‍රේල් මාසය තුළ නිරීක්ෂණය විය. නීතිමය ක්‍රියාමාර්ගවලට අදාළ සිදුවීම් 3ක්, නීති ප්‍රතිසංස්කරණ යන විෂයපථයට අයත් වන සිදුවීම් දෙකක් ඒ අතර වෙයි. මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සම්බන්ධ දණ්ඩමුක්තියද මෙම සංරචකය යටතට ගැනෙන බැවින් සිවරාම් අනුස්මරණය සම්බන්ධ අවස්ථාවන්ද මෙහි ඇතුළත් කෙරිණි.**

**3 වගුව: 2023 අප්‍රේල්: නීතිමය කොන්දේසි - සිදුවීම් 06**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 03 |
| නීති ප්‍රතිසංස්කරණ | 02 |
| මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සම්බන්ධ දණ්ඩමුක්තිය | 01 |
| **එකතුව** | **06** |

01. **වසන්ත මුදලිගේ නිදහස් කිරීමට එරෙහි අභියාචනය, කොළඹ මහාධිකරණය හමුවේ කැඳවීම.**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර සිටි අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ හිටපු කැඳවුම්කරු වසන්ත මුදලිගේ නිදහස් කිරීමට කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය ලබා දුන් තීන්දුවට එරෙහිව නීතිපතිවරයා විසින් මෙම අභියාචනය ගොනු කොට තිබේ. පෙත්සමේ නෛතික දෝෂයක් නිවැරදි කිරීම සඳහා අප්‍රේල් 3 වැනිදා මෙම නඩුව කැඳවා තිබූ අතර නැවත ජූනි 1 වැනිදා කැඳවීමට නියම කෙරිණි.

මූලාශ්‍රය: dasathalankanews.com

02. **ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම කල් දැමීමට තීරණය කළ බව අධිකරණ ඇමතිවරයා ප්‍රකාශ කිරීම.**

2023 මාර්තු 17 වැනිදා ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද 'ත්‍රස්ත විරෝධී' පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති ඉල්ලීම් සලකා බලා, එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම කල් දැමීමට තීරණය කළ බව අධිකරණ ඇමතිවරයා අප්‍රේල් 6 වැනිදා ප්‍රකාශ කළේය.

අධිකරණ නිවාඩු කාලය (court vacation) හේතුවෙන් පනත සම්බන්ධයෙන් අධිකරණයට යෑමට බාධා මතුවන තත්ත්වය සැලකිල්ලට ගෙන පනත ඉදිරිපත් කිරීම මෙසේ ප්‍රමාද කළ බවද ඔහු සඳහන් කළේය.

මූලාශ්‍රය: theleader.lk

03. **පාස්කු ප්‍රහාරය සම්බන්ධ විරෝධතාවක් තහනම් කරන ලෙස පොලිසිය කළ ඉල්ලීමක් අධිකරණය ප්‍රතික්ෂේප කිරීම.**

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාර මාලාවෙන් මියගිය පුද්ගලයන්ට සහ වින්දිතයන්ට සාධාරණය ඉටු කරන ලෙස බල කරමින් අප්‍රේල් 21 වැනිදා පැවැත්වීමට නියමිත වූ විරෝධතාවක් තහනම් කරන්නැයි පොලිසිය කළ ඉල්ලීමක් මීගමුව වැඩ බලන මහේස්ත්‍රාත් ඉන්දික ද සිල්වා විසින් ප්‍රතික්ෂේප කෙරිණි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 සහ 14 ව්‍යවස්ථා අනුව මහජනතාවට සාමකාමීව එක්රැස්වීමට හා අදහස් ප්‍රකාශ කිරීමට ලබා දී ඇති අයිතිය, පොලිසියේ උපකල්පන මත පිහිටා තහනම් කිරීමට අධිකරණයට හැකියාවක් නොමැති බව මහේස්ත්‍රාත්වරයා එහිදී අවධාරණය කළේය.

මූලාශ්‍රය: thetime.lk

04. **සමාජ මාධ්‍ය ක්‍රියාකාරික දර්ශන හඳුන්ගොඩට එරෙහිව අධිකරණයෙන් වාරණ නියෝගයක් පැනවීම.**

'එක්ස්ප්‍රස් පර්ල්' වන්දි නඩුව සම්බන්ධයෙන් අසත්‍ය කරුණු සහ නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල්වරයකුට හා රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරියකට අපහාසාත්මක වන ආකාරයේ කරුණු යූටියුබ් නාලිකාව ඔස්සේ පළ කිරීම වළක්වමින් කොළඹ දිසා අධිකරණය මගින් මෙම වාරණ නියෝගය පනවා තිබේ.

අතිරේක සොලිසිටර් ජනරාල් වීකුම් ද ආබෲ හා රජයේ අධිනීතිඥ නයෝමි කහවිට ඉදිරිපත් කළ පැමිණිල්ලක් සලකා බැලීමෙන් අනතුරුව කොළඹ දිසා විනිසුරු පූර්ණිමා පරණගම විසින් මෙම වාරණ නියෝග නිකුත් කෙරුණු අතර මැයි 10 වැනිදා දක්වා එය බලපැවැත්වේ.

මූලාශ්‍රය: theleader.lk

05. **ගුවන්විදුලි හා රූපවාහිනී සේවා නියාමනය සඳහා නව පනතක් කෙටුම්පත් කරන බව ජනමාධ්‍ය ඇමතිවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කිරීම.**

ශ්‍රී ලංකාවේ මේ වන විට බලපත්‍ර ලත් රූපවාහිනී ආයතන 25ක් සහ ගුවන් විදුලි ආයතන 51ක් ඇති බවත්, එම බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදයෙහි සහ කොන්දේසිවල බරතපළ විෂමතා පවතින බවත් ඇමතිවරයා ප්‍රකාශ කළේය. මේ පිළිබඳ නිසි ක්‍රමවේදයක් ඇති කිරීමට විද්‍යුත් විකාශන අධිකාරී පනතක් කෙටුම්පත් කිරීමට විජේදාස රාජපක්ෂ ඇමතිවරයා ප්‍රමුඛ පාර්ලිමේන්තු අනු කමිටුවක් පත් කොට ඇති බවද එහිදී ප්‍රකාශ කෙරිණි.

මූලාශ්‍රය: theleader.lk

06. **ඝාතනයට ලක්වූ මාධ්‍යවේදී ධර්මරත්නම් සිවරාම් අනුස්මරණය කිරීම.**

මීට වසර 18කට පෙර පැහැරගෙන ගොස් ඝාතනය කෙරුණු තරාකී නමින් ප්‍රකට මාධ්‍යවේදී ධර්මරත්නම් සිවරාම් අනුස්මරණය කිරීමේ අවස්ථා දෙකක්, අප්‍රේල් 29 වැනිදා මඩකලපුවේදී සහ මුලතිව්හිදී පැවැත්විණි. එම ප්‍රදේශ පදනම් කර ගත් මාධ්‍යවේදී සංවිධාන මගින්, මෙම සැමරුම් සංවිධානය කර තිබිණි.

මූලාශ්‍ර: twitter.com/JDSLanka, twitter.com/JDSLanka

## වෘත්තියවේදීත්වය

**වෘත්තියවේදීත්වය යන සංරචකය යටතට, මාධ්‍යවේදීන්ට හොඳ අධ්‍යාපනයක් තිබීම, මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි, මාධ්‍යවේදීන් කර්තෘමණ්ඩල හා ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය, ස්වයං වාරණය, වෘත්තීය සමිති හා සංගම් මගින් මාධ්‍යවේදියාගේ ස්වාධීනත්වය, තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය, මාධ්‍ය වෘත්තියට ඇති පිළිගැනීම යන දර්ශක ඇතුළත් වේ. මෙම සංරචකය යටතට ගැනෙන සිදුවීමක් අප්‍රේල් මාසයේදී නිරීක්ෂණය විය.**

4 වගුව: 2023 අප්‍රේල්: වෘත්තියවේදීත්වය - සිදුවීම් 01

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මාධ්‍යවේදීන් කර්තෘමණ්ඩල හා ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය | 01 |
| **එකතුව** | **01** |

1. **සියදිවි නසාගැනීමක් පිළිබඳ ආචාරධර්මවලට පටහැනි වාර්තාකරණයක් සම්බන්ධයෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.**

   තරුණ සමාජ ක්‍රියාකාරිකයකු වූ බුද්ධි ප්‍රබෝධ කරුණාරත්නගේ මරණය පිළිබඳව දිනමිණ පුවත්පත අප්‍රේල් 20 වැනිදා පළ කළ පුවතක් සම්බන්ධයෙන් පුවත්පත් පැමිණිලි කොමිසම වෙත මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත. අදාළ වාර්තාකරණයේදී, සියදිවි නසාගැනීම් වාර්තාකරණය පිළිබඳ ආචාරධර්ම දැඩි ලෙස උල්ලංඝනය කර ඇති බවත්, දේශපාලන අභිමතාර්ථයන් මත, මියගිය පුද්ගලයාට අගතියක් සිදු වන අන්දමින් කටයුතු කර ඇති බවත් පැමිණිල්ලෙහි දැක්වේ.

   මූලාශ්‍රය: rata.lk

## වයුහාත්මක කොන්දේසි

**මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම සංරචකයට ඇතුළත්ය. මේ අතුරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන සිදුවීම් 4ක් මෙහි ඇතුළත් වේ. භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසද ඇතුළුව මූලික අයිතිවාසිකම් බරපතළ ලෙස අභියෝග යට ලක් කෙරෙන, යෝජිත ත්‍රස්ත විරෝධී පනත සම්බන්ධයෙන් බලවත් පාර්ශ්ව කිහිපයක ප්‍රතිචාර ඊට අයත් ය.**

5 වගුව: 2023 අප්‍රේල්: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 04

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 04 |
| **එකතුව** | **04** |

01. **රජය විසින් කෙටුම්පත් කර ඇති නව ත්‍රස්ත විරෝධී පනත ප්‍රජාතන්ත්‍රවාදයට බරපතළ තර්ජනයක් බව හියුමන් රයිට්ස් වොච් සංවිධානය ප්‍රකාශ කිරීම.**

    රැස්වීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසද ඇතුළුව ශ්‍රී ලාංකිකයන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට මෙම පනත බලය ලැබෙන බව පෙන්වා දෙන එම සංවිධානය, යෝජිත ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත රජය ඉවත් කර ගත යුතු බවත් ඉදිරියේදී සම්මත කිරීමට අදහස් කරන ඕනෑම ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පතක් ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල විය යුතු බවත් අවධාරණය කරයි.

    මූලාශ්‍රය: www.hrw.org

02. **යෝජිත ත්‍රස්ත විරෝධී පනතට ඇමරිකානු ජනාධිපතිවරයා විරෝධය පළ කළ යුතු යැයි ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය (Amnesty International) ප්‍රකාශ කිරීම.**

    අදාළ කෙටුම්පත සෑම මානව හිමිකම් මිණුම් ලකුණකින්ම නිශ්චිතවම අසමත් බවත්, ශ්‍රී ලාංකීය ජනතාවගේ අයිතිවාසිකම් අගය කරන්නේ නම්, මෙම නීතිය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කළ යුතු හෝ ඉවත් කළ යුතු බවට ඇමරිකානු ජනාධිපතිවරයා, ශ්‍රී ලංකාවේ ජනාධිපති රනිල් වික්‍රමසිංහට පැහැදිලි පණිවිඩයක් යැවිය යුතු බවත් එම සංවිධානය කියා සිටී. යෝජිත නීති සම්පාදනය, 'මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණ සඳහා දශක ගණනාවක් තිස්සේ පෙනී සිටි ශ්‍රී ලංකාවේ සිවිල් සමාජයට අපහාසයක්' බවද

එය 'විවේචකයන් ඉලක්ක කර නිශ්ශබ්ද කිරීමට රජයට ඇති හැකියාව ඉහළ නැංවීමේ උත්සාහයක්' බවද අදාළ නිවේදනයෙහි වැඩිදුරටත් සඳහන් වේ.

මූලාශ්‍රය: www.amnestyusa.org

03. **යෝජිත ත්‍රස්ත විරෝධී පනත ඉවත් කර ගන්නා ලෙස ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම (ICJ) ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටීම.**

මෙම පනත මගින් මරණ දඬුවම පැනවීමට දැඩි විරෝධය පළ කරන එම සංවිධානය, මෙය 'ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් දැනට පවතින මානව හිමිකම් කඩකිරීම් වාර්තාව බිඳ දැමීමට' හේතු වනු ඇතැයි ප්‍රකාශ කරයි. යෝජිත පනතෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි වගන්තියෙන් ආරක්ෂා කර ඇති භාෂණයේ සහ ප්‍රකාශනයේ, සාමකාමීව රැස්වීමේ හා සමාගමයේ නිදහස යන අයිතිවාසිකම් මෙන්ම, 13 වැනි වගන්තියෙන් තහවුරු කර ඇති අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමෙන් නිදහස් වීමේ අයිතිය උල්ලංඝනය වන බවත් ICJ අවධාරණය කර ඇත.

මූලාශ්‍රය: www.icj.org

04. **යෝජිත ත්‍රස්ත විරෝධී පනත පිළිබඳව විමර්ශනය කිරීමට ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් කමිටුවක් පත් කරනු ලැබීම හා එම කමිටු වාර්තාව එළිදැක්වීම.**

2023 මාර්තු 17 වැනිදා ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කළ යෝජිත ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත සමාලෝචනය සඳහා ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන්ගෙන් සමන්විත කමිටුවක් පත්කළ බව ශ්‍රී ලංකා නීතිඥ සංගමය අප්‍රේල් 5 වැනිදා නිවේදනය කළ අතර, එම කමිටුවේ වාර්තාව අප්‍රේල් 26 වැනිදා එළිදැක්විණි.

අදාළ පනත මගින් භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසද ඇතුළුව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන බවද එහි වගන්ති 17කින්, අපරාධ නීති සංග්‍රහයේ මූලධර්ම උල්ලංඝනය වන බවද එම වාර්තාවෙහි දැක්වේ.

මූලාශ්‍ර: basl.lk, basl.lk/media-statement

**5 වගුව: මාධ්‍ය නිදහස: 2023 ජනවාරි - අප්‍රේල් දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| **ආවරණය කර ඇති සංරචකය** | **2023 ජනවාරි - මාර්තු** | | **2023 අප්‍රේල්** |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 04 | - | 04 |
| නීතිමය කොන්දේසි | 26 | 02 | 06 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | - | - | - |
| වෘත්තීයවේදීත්වය | 01 | - | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 07 | - | 04 |
| **එකතුව** | **38** | **02** | **15** |

පසුගිය මාධ්‍ය නිදහස මාසික වාර්තා මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදි නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


## Free Media Movement

Convener: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer: Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25


Layout: Nalinda Seneviratne